විභාග අංකය: DY -　　　　පිටු ගණන:

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා පරීක්ෂණය - 2021/2022

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2022 මාර්තු)

# DY 07 - ව්‍යාපාර පරිසරය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

1. ප්‍රශ්න හතරකට පමණක් (04) පිළිතුරු සපයන්න.
2. කාලය පැය දෙකයි (02)
3. මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.
4. පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.
5. ප්‍රශ්න පත්‍රයේ යම් පිටවුක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.
6. පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කර තනි PDF ගොනුවක් සාදන්න.

1. (i) ව්‍යාපාර පරිසරය (Business Environment) ලෙස ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 08)

(ii) ඒ ඒ ව්‍යාපාරයට අදාළ නීතිමය බලපෑම වෙනස්ය. උදාහරණ සහිතව පහදන්න.

(ලකුණු 08)

(iii) රටක ව්‍යාපාර පද්ධතිය පුළුල් වීම කෙරෙහි කුමන කරුණු බලපාන්නේදැයි පහදන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 25)

2. (i) ‘‘ව්‍යවසායකයා’’ (Entrepreneur) ලෙස ඔබ අදහස් කරන්නේ කෙබඳු අයෙක්ද? පහදන්න.

(ලකුණු 08)

(ii) ‘‘ව්‍යවසායකයා’’ හා ‘‘ව්‍යාපාරිකයා’’ අතර ඔබ දකින වෙනස්කම් මොනවාද?

(ලකුණු 08)

(iii) රටක සංවර්ධනයට ව්‍යවසායකගේ දායකත්වය විස්තර කරන්න.

(ලකුණු 09)

(මුළු ලකුණු 25)

3. (i) වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ දෙන ඩොලර් හිඟයට විසඳුම් ලෙස ඔබ ඉදිරිපත් කරන යෝජනා මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 09)

(ii) ආනයන පරිමාව හා අපනයන පරිමාව (Import & Export Volume) අතර ඇති සෘණ පරතරය සම්බන්ධයෙන් විසඳුම් ලෙස ඔබගේ අදහස් මොනවාද?

(ලකුණු 08)

(ii) ගෝලීය වශයෙන් ඇතිවන අර්බුදයකට මුහුණදීම සඳහා රටක ප්‍රතිපත්තිය කෙබඳු විය යුතුද? පහදන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 25)

4. (i) ව්‍යාපාර සම්බන්ධයෙන් "තොග පාලනය" (Inventory control) යන්නෙහි අදහස කුමක්ද?

(ලකුණු 08)

(ii) ගබඩාවක ඇති තොග මට්ටම් සඳහන් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(iii) ගබඩාවකට තොග ඇණවුම් කළ යුත්තේ කුමන අවස්ථාවකදීද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 09)

(මුළු ලකුණු 25)

5. "ව්‍යාපාර ක්ෂේත්‍රයට ඍජු ලෙස සම්බන්ධ වන්නේ මූල්‍ය ක්ෂේත්‍රයයි." (Finance Field)

(i) ව්‍යාපාර හා මූල්‍ය ක්ෂේත්‍රය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරන්න.

(ලකුණු 8)

(ii) ව්‍යාපාර ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය මඟින් ඇතිකරන බලපෑම කෙබඳුද?

(ලකුණු 08)

(iii) "ඕනෑම බැංකුවක් මූල්‍යායතනයක් වන අතර ඕනෑම මූල්‍යායතනයක් බැංකුවක් නොවේ." පහදන්න.

(ලකුණු 09)

(මුළු ලකුණු 25)

6. කෙටි සටහන් ලියන්න.

(i) සන්නිවේදනය

(ii) රක්ෂණය

(iii) මහජන සම්බන්ධතාව

(iv) ප්‍රවාහනය

(v) විගණනය

(ලකුණු 5x5 = 25 )



*******